**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2024.12.19 පැය 0620 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 1864 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු.**

## 01. අපරාධ වලට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - ජාඇල පොලිස් ස්ථානය.

2024.12.18 වන දින උදෑසන කාලයේ ජාඇල පොලිස් වසමේ ඒකල ප්‍රදේශයේදී ජාඇල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර අපරාධ වලට අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 වයසේ පසුවන දෙල්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් සම්බන්ධයෙන් සිදුකල වැඩිදුර විමර්ශනයේදී ජාඇල පොලිස් ස්ථානයට වාර්තා වී තිබූ රන් අත් පළඳනාවක් කොල්ලකෑමේ අපරාධයටත්, රාගම,මහබාගේ,මාලඹේ හා වැල්ලම්පිටිය යන පොලිස් ස්ථාන වෙත වාර්තා වී තිබූ රන් මාල කොල්ලකෑම් සිද්ධීන් 02ක් හා යතුරුපැදි සොරකම් සිද්ධීන් 02ක් සඳහා අවශ්‍ය කර සිටි සැකකරුවන් දෙදෙනෙකු බවටත්, එක් සැකකරුවෙකුට පූගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් වරෙන්තු නිකුත් වී ඇති බවටත් අනාවරණය වී ඇත.

සැකකරුවන් විසින් සොරකම් කරන ලද රන්මාල 02ක්, යතුරුපැදි 02ක් හා උණු කර තිබූ රන් ගුලියක් පොලිසිය විසින් සොයාගෙන ඇත. ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. දේපල සොරකමකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - බොරැල්ල පොලිස් ස්ථානය.

2024.12.18 වන දින බොරැල්ල වසම තුල අපරාධ නිවාරණ රාජකාරි යෙදී සිටි බොරැල්ල පොලිස් ස්ථානයේ නිලධාරින් කණ්ඩායමක් විසින් සැකකටයුතු ලෙස බොරැල්ල පොලිස් වසමේ සැරිසරමින් සිටි පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන ඇත. අත්අඩංගුවට ගත් සැකකරු සම්බන්ධව සිදුකළ විමර්ශනයේදී මොහු කැගල්ල පොලිස් වසමේ නිවසක් බිඳ රුපියල් ලක්ෂ 34 කට ආසන්න වටිනාකමකින් යුතු රන් භාණ්ඩ ඇතුළු දේපල සොරකමකට සම්බන්ධ සැකකරු බවට අනාවරණය වී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31ක් වන නාමල්ගම, කෑගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අත්අඩංගුවට ගත් සැකකරුගෙන් අනාවරණය කර ගත් කරුණු මත ඉහත අපරාධය සිදුකර සොරාගන්නා ලද ලැප් ටොප් 01 ක්, රන් මුදු 05 ක්, රන් වළලු 03, රන් මාල 01, රන් අත්පළඳනා 03, ජංගම දුරකථනයක්, අත් ඔරලෝසුවක් හා සොරකම් කරන ලද භාණ්ඩ විකුණා ලබා ගත් රුපියල් 15,000/= ක මුදලක් පොලිස් භාරයට ගෙන ඇත. බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. හැෂ් මත්ද්‍රව්‍ය සහ අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කඩුගන්නාව පොලිස් ස්ථානය.**

2024.12.18 වන දින දහවල් කාලයේ කඩුගන්නාව පොලිස් වසමේ මඩරන්ගොඩ ප්‍රදේශයේදී කඩුගන්නාව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හැෂ් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 72 මිලිග්‍රෑම් 390 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 69 මිලිග්‍රෑම් 110 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන වැරැල්ලගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඩුගන්නාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - කටුනායක පොලිස් ස්ථානය.**

2024.12.18 වන දින උදෑසන කාලයේ කටුනායක පොලිස් වසමේ හීනටියන ප්‍රදේශයේදී කටුනායක පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 150 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන හීනටියන,මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සැකකරුගෙන් සිදු කරන ලද වැඩිදුර ප්‍රශ්න කිරීමේදී සැකකරුගේ සහෝදරයෙකු වෙළඳසැලක් බිඳ දේපල සොරකම් කිරීමේ අපරාධයට හා මිනුවන්ගොඩ ගරු මහේස්ත්‍රාත් අධිකරණය මගින් වරෙන්තු 05ක් සඳහා කටුනායක පොලිස් ස්ථානයට අවශ්‍ය කර සිටි සැකකරුවෙකු බවට අනාවරණය කර ගැනීමෙන් පසු යාගොඩමුල්ල ප්‍රදේශයේදී අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 100ක් සමග එම සැකකරු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන හීනටියන, මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කටුනායක පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කඩවත පොලිස් ස්ථානය.**

2024.12.18 වන දින උදෑසන කාලයේ කඩවත පොලිස් වසමේ ඉහල බියන්වල ප්‍රදේශයේදී කඩවත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 300 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන ගෝනහේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය**

2024.12.18 වන දින උදෑසන කාලයේ කඳාන පොලිස් වසමේ වීදි මාවත ප්‍රදේශයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 200 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන කඳාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.12.18 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ කටුකුරුඳුවත්ත ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 350 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වන බොරලැස්ගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**08. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.12.18 වන දින සවස් කාලයේ මිනුවන්ගොඩ පොලිස් වසමේ පත්තඩුවන ප්‍රදේශයේදී ගම්පහ කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 130 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන මිනුවන්ගොඩ පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 27 ක් වන ගම්පහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිනුවන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. බීඩි කොළ තොගයක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වෙන්නප්පුව පොලිස් ස්ථානය.

2024.12.18 වන දින අළුයම් කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ බෝලවත්ත ප්‍රදේශයේ අපරාධ නිවාරණ රාජකාරි යෙදී සිටි නිලධාරීන් කණ්ඩායමක් විසින් සැකකටයුතු ලොරි රථයක් නැවැත්වීමට සංඥා කිරීමේදි එම ලොරි රථය පොලිස් අණ නොතකා පලා ගොස් ඇත. නිළධාරින් විසින් එම ලොරි රථය කිලෝමීටර් හතරක පමණ දුරක් ලුහුබැඳ ගොස් නවතා පරීක්ෂා කර ඇත. එහිදී ලොරි රථය තුල තිබී **නීති විරෝධී ලෙස මෙරටට රැගෙන එන ලද බීඩි කොළ කිලෝ 1204 ක් අඩංගු ගෝනි 43 ක්** තිබී ඇති අතර, එම ලොරි රථයේ රියදුරු හා එහි ගමන් ගත් තවත් පුද්ගලයෙකු බිඩි කොළ තොගය හා ලොරි රථය ද සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 21 හා 33 ක් වන කටාන හා කොච්චිකඩේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. නීති විරෝධී මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සීතාවකපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.

2024.12.18 වන දින දහවල් කාලයේ අවිස්සාවේල්ල පොලිස් වසමේ ඇපලපිටිය ප්‍රදේශයේදී සීතාවකපුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් පෙරීමට යොදා ගන්නා ගෝඩා ලීටර් 1151 (බැරල් 06 ) ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අවිස්සාවේල්ල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන අවිස්සාවේල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අවිස්සාවේල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. නීති විරෝධී මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මීගමුව පොලිස් ස්ථානය.

2024.12.18 වන දින සවස් කාලයේ මීගමුව පොලිස් වසමේ දූනගහ ප්‍රදේශයේදී මීගමුව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **නීති විරෝධි මත්පැන් ලීටර් 57.5 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35 ක් වන කඩවල, දූනගහ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මීගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**12. මැරීමට තහනම් සතෙකු වන ගෝන මස් යැයි සැක සිතිය හැකි මස් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට - ඇතිමලේ පොලිස් ස්ථානය.**

2024.12.18 වන දින රාත්‍රී කාලයේ ඇතිමලේ පොලිස් වසමේ කොටපාර ප්‍රදේශයේදී ඇතිමලේ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර  මැරීමට තහනම් සතෙකු වන ගෝන මස් යැයි සැක සිතිය හැකි මස් කිලෝ 49ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26, 30 හා 36 යන වයස් වල පසුවන මොණරාගල, බුත්තල හා සිරිපුර යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඇතිමලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**13. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - නිකවැරටිය පොලිස් ස්ථානය.**

2024.12.18 වන දින නිකවැරටිය පොලිස් වසමේ කපුරැන ප්‍රදේශයේදී නිකවැරටිය පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 35ක් වන කපුරැන, නිකවැරටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

නිකවැරටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**14. ගණිකා නිවාස දෙකක් වටලා සැකකාරියන් පස් දෙනෙකු  අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් වසම.**

2024.12.18 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ වෙරළ පාර සහ මැලිබන් හන්දිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර සම්භාහන මධ්‍යස්ථාන මුවාවෙන් පවත්වාගෙන ගිය ගණිකා නිවාස දෙකක් වටලා ගණිකා නිවාස කළමනාකරණය කිරීම සම්බන්ධව සැකකාරියන් දෙදෙනෙකු සහ ගණිකා වෘත්තියේ යෙදීම සම්බන්ධව සැකකාරියන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් අවුරුදු 24 ත් 43 අතර වයස් වල පසු වන මාතලේ, යක්කලමුල්ල,මාවනැල්ල,බෙන්තර හා පානදුර යන ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**15. විදුලි සැර වැදී දැරියක් මියයාම- නවගත්තේගම පොලිස් වසම.**

2024.12.18 වන දින රාත්‍රී කාලයේ නවගත්තේගම පොලිස් වසමේ තරණගහවැව ප්‍රදේශයේදී ගැහැණු දරුවෙකුට විදුලි සැර වැදී පුත්තලම රෝහල වෙත ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට නවගත්තේගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 14 ක් වූ ඉහලකුරුකැටියාව,නවගත්තේගම ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනාරක්ෂිත විදුලි රැහැනක් මගින් බ්‍රෙන්ඩරයකට විදුලිය ලබා ගෙන එය ක්‍රියාත්මක කිරීමට යාමේදී විදුලි සැර වැදී මෙම මරණය සිදුව ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය පුත්තලම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නවගත්තේගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 16. ළිදකට වැටීමෙන් කාන්තාවක් මියයාම - පේරාදෙණිය පොලිස් වසම.

2024.12.18 වන දින උදෑසන කාලයේ පේරාදෙණිය පොලිස් වසමේ දොඩම්වල පහල, මුරුතලාව ප්‍රදේශයේදී ළිදකට වැටී කාන්තාවක් මියගොස් ඇති බවට පේරාදෙණිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 74 ක් වූ මුරුතලාව ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මරණකාරිය සිහි මද බවින් පසුවන කාන්තාවක් වන අතර, සිය මව නිවසේ නොසිටීම හේතුවෙන් ඇයගේ දියණිය විසින් සිදුකරන ලද සොයා බැලීමේදී නිවස ආසන්නයේ ඇති ළිදකට වැටී සිටිනු දැක ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය සම්බන්ධ පශ්චාත් මරණ පරීක්ෂණයෙන් පසු ඥාතීන්ට භාරදී ඇති අතර පේරාදෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 17. මාරක රිය අනතුරක් - කඩවත පොලිස් වසම.

2024.12.18 වන දින අළුයම් කාලයේ කඩවත පොලිස් වසමේ කඩවත මාවරමංඩිය මාර්ගයේ මංකඩ පාර ප්‍රදේශයේදී මාවරමංඩිය දෙස සිට කඩවත දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කනුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු හා පසුපැදිකරු රාගම රෝහලට ඇතුලත් කිරීමේදී පැදිකරු මියගොස් ඇත. පසුපැදිකරු වැඩිදුර ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහලට මාරුකර යවා ඇත.

**මරණකරු වයස අවුරුදු 21ක් වූ සිගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය රාගම රෝහලේ මෘත ශරිරාගාරයේ තැන්පත් කර ඇති අතර කඩවත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**